# සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය කුරුඳුවත්ත කඩවීදිය

# තනතුරු පුරප්පාඩු

සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 02/2019 චක්‍රලේඛය අනුව සුදුසුකම් සපුරන මහනුවර දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 2020.09.12 දින පෙ.ව. 12.00 ට හෝ එදිනට පෙර **"ගරු සභාපති, සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපාකර සමිතිය, කුරුඳුවත්ත කඩවීදිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **අයදුම් කරන තනතුර** සඳහන්කර එවිය යුතුය.

සමිතිය විසින් පිළියෙල කර ඇති අයදුම්පත් රු. 200/- ක මුදලක් ගෙවා රාජකාරී වේලාව තුළ සමිති ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකි අතර, අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ජායා පිටපත් එවිය යුතුය.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- පදිංචිය සනාථ කරන ග්‍රාමනිලධාරී සහතිකය
- චරිත සහතික 02 ක්
- අධ්‍යාපන සහතික

## 01. තනතුර : සාමාන්‍යාධිකාරී - (11-1)

**පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**වැටුප් පරිමාණ අංකය :** S:U:M:L - 01:01

**වැටුප් පරිමාණය :** 25,400 - 500 x 10 - 600 x 10 - 750 x 10 = 43,900/-

(ඉහත වැටුපට අමතරව මාසිකව රු. 5,000/- දීමනාවක් ලබාදෙන අතර, සේවක විශ්‍රාම වැටුප් හිමිකම්ද ඔබට හිමිවේ)

**වයස් සීමාව :** 18 - 45

**සුදුසුකම් :**

අ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් (රාජ්‍ය පරිපාලනය / කළමනාකරණය / වාණිජ / ව්‍යාපාර පරිපාලනය / ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රයක උපාධියක් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ)

හෝ

ආ. උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / වාණිජ ඩිප්ලෝමාව

හෝ

ඇ. මාස 09 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව / මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව / මාස 06 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති සමුපකාර සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ S:E:M:L - 02:01 වැ.ප. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරෙහි වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ S:E:M:L-02:03 වැ.ප. සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) තනතුරෙහි වසර 03 කට නොඅඩු ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

හෝ

ඈ. මාස 09 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව / මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව / මාස 06 ක් හෝ ඊට වැඩි අධ්‍යයන කාලයක් ඇති සමුපකාර සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග S:E:M:L-02:02 වැ.ප. සහකාර සාමාන්‍යාධිකාරී (වාණිජ) තනතුරෙහි වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම හෝ S:E:M:L-02:04 වැ.ප. සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) තනතුරෙහි වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

## 02. තනතුර - ලේකම් - (11-1)

**පුරප්පාඩු සංඛ්‍යාව : 01**

**වැටුප් පරිමාණ අංකය :** S:E:M:L-02:07

**වැටුප් පරිමාණය :** 19,100 - 440 x 10 - 540 x 10 - 690 x 10 = 35,800/-

(ඉහත වැටුපට අමතරව මාසික රු. 5,000/- දීමනාවක් ලබාදෙන අතර, සේවක විශ්‍රාම වැටුප් හිමිකම්ද ඔබට හිමිවේ)

**වයස් සීමාව :** 18 -45

**සුදුසුකම් :**

අ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය

හෝ

ආ. මානව සම්පත් කළමනාකරණය / ලේකම් පරිචය පිළිබඳ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත්වීම සමග සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරී තනතුරක වසර 03 ක ස්ථිර සේවා කාලයක සේවා පළපුරුද්ද.

## 03. තනතුර : ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක - (11-1)

**පුරප්පාඩු සංඛ්‍යාව : 01**

**වැටුප් පරිමාණ අංකය :** S:E:M:L-02:06

**වැටුප් පරිමාණය :** 19,100 - 440 x 10 - 540 x 10 - 690 x 10 - 35,800/-

(ඉහත වැටුපට අමතරව මාසිකව රු. 5,000/- දීමනාවක් ලබාදෙන අතර, සේවක විශ්‍රාම වැටුප් හිමිකම්ද ඔබට හිමිවේ)

**වයස් සීමාව :** 18 - 45

**සුදුසුකම් :**

අ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක්

හෝ

ආ. උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / වාණිජ ඩිප්ලෝමාව

හෝ

ඇ. මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණය / බැංකු හා මූල්‍ය කළමනාකරණය / විගණනය / ක්ෂුද්‍ර මූල්‍යකරණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය සමග මධ්‍යම කළමනාකරණ IV මට්ටමේ M:M:L-03:09 වැ.ප. පොත් තබන්නා තනතුරේ හෝ M:M:L-03:10 වැ. ප. ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / M:M:L-03:14 වැ.ප. සහකාර ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

හෝ

ඈ. අ.පො.ස. (උ.පෙළ) වාණිජ අංශයෙන් ගණකාධිකරණය ඇතුළුව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 04 කින් / ගණකාධිකරණයට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 03 කින් සමත්වීම සමග M:M:L-03:10 වැ. ප. ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / M:M:L-03:14 වැ. ප. සහකාර ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**සභාපති,**
**සී/ස ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය,**
**කුරුඳුවත්ත, කඩවීදිය.**
**2020.08.20**

Source: Dinamina (2020.08.20)